මගේ අංක : ඩී2/ජේ.උසස් (ජ්‍යෙෂ්ඨතාවය) -2025
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09
2025.09. 10.07

මූලස්ථාන අධිකාරි, සියළුම බන්ධනාගාර අධිකාරි සහ
සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත,

**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ II පෙළ ජේලර් (පිරිමි හා කාන්තා) තනතුර සඳහා කුසලතාවය මත උසස් කිරීම - 2025**

මෙම දෙපාර්තමේන්තුවේ II පෙළ ජේලර් (පිරිමි) තනතුරේ පුරප්පාඩු පිරවීම පිණිස 2025 ඔක්තෝම්බර් 24 දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති 2013.10.01 හෝ ඊට පෙර බන්ධනාගාර සැරයන් (පිරිමි) තනතුරට පත් වූ නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලබන අතර, II පෙළ ජේලර් (කාන්තා) තනතුරේ පුරප්පාඩු පිරවීම පිණිස 2025 ඔක්තෝම්බර් 24 දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති 2018.12.07 හෝ ඊට පෙර බන්ධනාගාර සැරයන් (කාන්තා) තනතුරට පත් වූ නිලධාරිනියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත පිරවීමට අපේක්ෂා කරන II පෙළ ජේලර් (පිරිමි) තනතුරේ පුරප්පාඩු සංඛ්‍යාව 28ක් වන අතර II පෙළ ජේලර් (කාන්තා) තනතුරේ පුරප්පාඩු සංඛ්‍යාව 04 කි.

**03.මාසික වැටුප් පරිමාණය :**

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි RS – 3/2025 (පියවර 1) වැටුප් ඛණ්ඩය අදාළ වේ. එම වැටුප් ඛණ්ඩයට හිමි වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු. 55410-7x670-2x890-25x1190-91630(මාසික)

(2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි රු. 55410/- ට අනුරූපී ආරම්භක පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ)

**04.කාර්යක්ෂමතා කඩඉම් :**

I. පළමු කාර්යක්ෂමතා කඩඉම II පෙළ ජේලර් තනතුරට පත්ව වසර තුනක් (03) ගතවීමට පෙර සමත් විය යුතුය. (අදාල ප්‍රශ්න පත්‍ර : බන්ධනාගාර ආඥා පනත දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග හා තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල විශෝධන විද්‍යාල ආඥා පනත / ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති / මුදල් රෙගුලාසි හා මූල්‍ය ක්‍රම)

II. දෙවන කාර්යක්ෂමතා කඩඉම II පෙළ ජේලර් තනතුරට පත්ව වසර තුනක් (05) ගතවීමට පෙර සමත් විය යුතුය. (අදාල ප්‍රශ්න පත්‍රය : මානව හිමිකම් හා සිරකරුවන්ට අදාළ ජාත්‍යාන්තර නීති රීති)

**05.භාෂා ප්‍රවීණතාවය :**

I. **රාජ්‍ය භාෂාව -** රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පත්වීම් දින සිට වසර 03ක් ඉකුත් වීමට පෙර ලබා ගත යුතුය.

II. **අනෙක් රාජ්‍ය භාෂාව -** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

Scanned with CamScanner

**06.කුසලතාවය මත II පෙළ ජේලර් තනතුරට උසස් කිරීම :**

II පෙළ ජේලර් තනතුරේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 25%ක් කුසලතාවය මත, සැරයන් නිලධාරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් II පෙළ ජේලර් තනතුරට උසස් කරනු ලැබේ. එකී සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල අනුව ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් පුරප්පාඩු සඳහා උසස් කරනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය මේ සමඟ අමුණා ඇත. තවද සම්මුඛ පරීක්ෂණයට කැඳවීම පත්වීමක් ලැබීමට සුදුසුකමක් නොවේ.

**07.සපුරාලිය යුතු සුදුසුකම් :**

I. **පළපුරුද්ද** : බන්ධනාගාර සැරයන්වරයකු වශයෙන් වසර 06ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හා නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම. (රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පැහැදිලි කිරීමට යටත්ව)

II. **කායික සුදුසුකම් :** සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

III. **වෙනත්** :

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
- තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**08.සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :**

- ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන් හි ඇතුලත් පත්කිරීම් හා උසස් කිරීම් සම්බන්ධ නීති හා රෙගුලාසි අදාල වේ.

**09. අයදුම්පත් යොමු කල යුතු ආකාරය :**

- ඉහත දක්වා ඇති සියළු සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරින් සම්බන්ධව මෙම නිවේදනය සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර ඔබගේ නිර්දේශය සහිතව (නම සහිත නිල මුද්‍රාව තබා නිර්දේශ කල යුතු වේ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන **2025 ඔක්තෝම්බර් 24** දිනට **හෝ ඊට පෙර ලැබෙන සේ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත එවිය යුතුය.**

- නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන අයදුම්පත්, නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්, නිවැරදි තොරතුරු ඇතුළත් නොකරන ලද අයදුම්පත් සහ නියමිත දිනයට පසුව එවනු ලබන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- නිලධාරියාගේ පුද්ගලික ලිපි ගොනු අංකය නිවැරදිව අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතුය.

10. අදාල අයදුම්පත්‍රයේ බන්ධනාගාර අධිකාරිගේ නිර්දේශය යටතේ සඳහන් තොරතුරු වගකීමකින් යුතුව ඔබ විසින් සම්පූර්ණ කර අදාළ නිර්දේශයන් සඳහන් කර මා වෙත එවීමට කටයුතු කරන්න. යම් හෙයකින් එම තොරතුරු නිරවද්‍ය නොවුණහොත්, ඔබ සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව ද දන්වා සිටිමි.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)

**එච්.එම්.එන්.සී. ධනසිංහ**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ 09.**

Scanned with CamScanner

## යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛපරීක්ෂණයේ ලකුණු පටිපාටිය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. ජ්‍යෙෂ්ඨතාවය සඳහා<br>රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හි සඳහන් විධි විධාන පරිදි සම්මුඛ පරීක්ෂණයේදී ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. | 60 | අදාළ නොවේ |
| කුසලතාවයට | 40 | අදාළ නොවේ |
| 02. අධ්‍යාපන සුදුසුකම් හා පාඨමාලා | 15 | |
| I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමන උපාධියක් හෝ ඉහළ සුදුසුකමක් සඳහා | 08 | |
| II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්, කාර්මික විද්‍යාලයකින් හෝ වෙනත් රජයේ පිළිගත් ආයතනයකින් පිරිනමන අවුරුද්දක් හෝ ඊට වැඩි ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 06 | |
| III. ඉංග්‍රිසි ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(මාස 06 කට නොඅඩු/පැය 720 කට නොඅඩු) | 04 | |
| IV. ඉංග්‍රිසි සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>(මාස 03 කට නොඅඩු/පැය 360 කට නොඅඩු) | 02 | |
| V. පරිගණක ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(මාස 06 කට නොඅඩු/පැය 720 කට නොඅඩු) | 04 | |
| VI. පරිගණක සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>(මාස 03 කට නොඅඩු/පැය 360 කට නොඅඩු) | 02 | |
| VII. දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කළ දින 2 හෝ ඊට වැඩි පුහුණු වැඩසටහනක් සඳහා(උපරිම ලකුණු 05 ) | 01 | |
| (එක් විෂය ක්ෂේත්‍රයක් සඳහා ලකුණු ලබා දෙනුයේ උපරිම සුදුසුකමට පමණි.) | | |
| 03. ප්‍රශංසා සඳහා | 05 | අදාළ නොවේ |
| පොදු 230 බී ආකෘති පත්‍රය මගින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් ලබා දී ඇති ප්‍රශංසාවකට ලකුණු 02 ක් සහ බන්ධනාගාර අධිකාරී ප්‍රශංසාවකට ලකුණු 01 බැගින් (බන්ධනාගාර අධිකාරී ප්‍රශංසාවකට උපරිමය ලකුණු 03) ලබාදෙනු ලබන අතර, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ දෝෂ දර්ශනයක් සඳහා ලකුණු 02 ක් ප්‍රශංසා සඳහා ලබාදෙනු ලබන උපරිම ලකුණු සීමාවට යටත්ව අඩු කරනු ලැබේ. | 05 | |
| 04. ක්‍රීඩා සඳහා | 05 | අදාළ නොවේ |
| I. ජාතික මට්ටමේ ක්‍රීඩා ජයග්‍රහණ සඳහා | 05 | |
| II. රාජ්‍ය සේවා තරඟ ජයග්‍රහණ සඳහා | 04 | |
| III. අන්තර් බන්ධනාගාර තරඟ ජය ගැනීම | 02 | |
| IV. බන්ධනාගාරය නියෝජනය කරමින් පළාත්/ දිස්ත්‍රික්මට්ටමේ ක්‍රීඩා ජයග්‍රහණ සඳහා<br>(උපරිම ලකුණු 02) | 01 | |
| V. අන්තර් බන්ධනාගාර තරඟ සහභාගිත්වය සඳහා (උපරිම ලකුණු 01) | 1/2 | |
| (එක් ක්‍රීඩාවක් වෙනුවෙන් උපරිම මට්ටම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | | |
| 05. සමිති සමාගම්වල දැරූ තනතුරු | 05 | අදාළ නොවේ |
| I. දෙපාර්තමේන්තු මට්ටමේ සමිති සමාගම්වල ප්‍රධාන තනතුරක් සඳහා එක් වසරකට | 02 | |
| II. දෙපාර්තමේන්තු මට්ටමේ සමිති සමාගම්වල වෙනත් තනතුරක් සඳහා එක් වසරකට | 01 | |
| III. ආයතන මට්ටමේ සමිති සමාගම්වල ප්‍රධාන තනතුරක් සඳහා එක් වසරකට | 01 | |
| IV. ආයතන මට්ටමේ සමිති සමාගම්වල වෙනත් තනතුරක් සඳහා එක් වසරකට<br>(උපරිම ලකුණු 02) | 1/2 | |
| (සටහන : ඉහත අංක 05 යටතේ ප්‍රධාන තනතුරු - සභාපති/ලේකම්/භාණ්ඩාගාරික) | | |
| 06. දැරූ වගකීම් හා කාර්යාල සේවය | 05 | අදාළ නොවේ. |
| I. සිර මැදිරියක කාර්යභාර නිලධාරියෙකු වශයෙන් කටයුතු කිරීම එක් වසරකට | 02 | |
| II. කාර්යාලයක කාර්යභාර නිලධාරි ලෙස කටයුතු කිරීම එක් වසරකට | 01 | |
| III. බන්ධනාගාර හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ අවම වසර 5ක්සේවය කිරීම | 02 | |
| 07. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | අදාළ නොවේ |
| I. නායකත්වය | 02 | |
| II. සන්නිවේදන හැකියාව | 02 | |
| III. පෞරුෂත්වය | 01 | |
| සටහන - 2.1 සඳහා ලකුණු ලබා දීමේදි අයදුම් කිරීමේදි සලකා බැලූ මූලික සුදුසුකම් හැර අනෙකුත් සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. | | |

Scanned with CamScanner

**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ II පෙළ ජේලර් (පිරිමි හා කාන්තා) තනතුර සඳහා කුසලතාවය මත උසස් කිරීම (2025) සඳහා ආදර්ශ අයදුම් පත්‍රය**

පුද්ගලික ලිපි ගොනු අංකය :- ☐

01. අයදුම්කරුගේ මුලකුරු සමඟ නම :-......................................................................

මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) :-......................................................................

අයදුම්කරුගේ සම්පූර්ණ නම :-......................................................................

..........................................................................................................................................

සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :-......................................................................

..........................................................................................................................................

02. උපන්දිනය :-......................................................................

අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස :- අවුරුදු:-............... මාස:-.............. දින:-........

03. ජාතික හැඳුනුම්පත් අංකය :-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

04.ස්ත්‍රී/පුරුෂ භාවය :- ස්ත්‍රී ☐ පුරුෂ ☐

05. ස්ථිර ලිපිනය :-......................................................................

..........................................................................................................................................

06. කාර්යාලීය ලිපිනය :-......................................................................

..........................................................................................................................................

07. දුරකථන අංකය :-

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

08. ස්ථිර සැරයන් තනතුරට පත් වූ දිනය :-......................................................................

සැරයන් තනතුරෙහි සේවා කාලය (2025.10.24 දිනට) :- අවුරුදු:-............... මාස:-.............. දින:-........

09. වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර:-......................................................

ලබා ගෙන ඇති අඩ වැටුප් හා වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර :-.................................................

10.කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වූ හෝ නිදහස් කළ දිනයන්

පළමු කාර්යක්ෂමතා කඩඉම :-......................................................................

දෙවන කාර්යක්ෂමතා කඩඉම :-......................................................................

සහන කාලය ලබා දී තිබේ නම් ඒ සම්බන්ධ විස්තර :-......................................................................

Scanned with CamScanner

11. ඔබට විරුද්ධව මේ වන විට මූලික විමර්ශනයක්, විනය පරීක්ෂණක් ආරම්භ කර තිබේද? ඔව් / නැත
(ඔව් නම් විස්තර සඳහන් කරන්න) :- ..........................................................................................................

චෝදනා පත්‍රයක් නිකුත් කර තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න:- ..........................................................

12. ...................... දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා තිබේද? :-

..........................................................................................................................................

13.දැනට දරණ තනතුරට පත් වීමෙන් අනතුරුව ජ්‍යෙෂ්ඨත්වයෙන් පහත හෙලා ඇත්නම් ඒ පිළිබඳ විස්තර (ජ්‍යෙෂ්ඨත්වය පහත වැටීමට හේතු හා ඒ ඒ හේතූන් මත පහත වැටී ඇති ජ්‍යෙෂ්ඨත්ව කාල සීමාව පැහැදිලිව සඳහන් කළ යුතු වේ):-

..........................................................................................................................................

14. 2025 ඔක්තෝම්බර් 24 දිනයට පූර්වාසන්න වසර 06 තුල වැටුප් වර්ධක උපයා ගැනිම පිළිබඳ විස්තර :- (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න)

| වර්ෂය | වැටුප් වර්ධක උපයා ගැනිම | |
|---|---|---|
| | ඇත | නැත |
| 2019 | | |
| 2020 | | |
| 2021 | | |
| 2022 | | |
| 2023 | | |
| 2024 | | |
| 2025 | | |

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සඳහන් කර ඇති තොරතුරු කිසිවක් වැරදි හෝ අසත්‍ය බව මා උසස් කරනු ලැබීමට පෙර සනාථ වුවහොත් මගේ අයදුම්පත අවලංගු වීමට යටත් වන බව හා උසස් කරනු ලැබීමෙන් පසුව හෙළිවුවහොත් මාගේ පත්වීම අවලංගු වන බවත් මම දනිමි.

දිනය:- ................................ ......................................................

අයදුම්කරුගේ අත්සන

Scanned with CamScanner

**<u>බන්ධනාගාර අධිකාරිගේ නිර්දේශය</u>**

01) ඉහත අංක 01 සිට 14 දක්වා නිලධාරියා/ නිලධාරිනිය විසින් සඳහන් කර ඇති කරුණු වල නිවැරදිතාවය පහත පරිදි තහවුරු කරන්න. (නිවැරදි නොවන්නේ නම් ඉදිරියෙන් නිවැරදි තොරතුරු ඇතුළත් කරන්න)

- 01 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 02 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 03 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 04 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 05 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 06 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 07 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 08 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 09 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 10 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 11 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 12 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 13 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................
- 14 කරුණ - නිවැරදියි / වැරදියි ..............................................................................................

බන්ධනාගාර සැරයන් ............................................ නිලධාරියා/ නිලධාරිනිය මෙම ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ පෙරාතුව, ඔහු / ඇය සම්බන්ධව විසඳීමට විනය පරික්ෂණ ඇති /නැති බවත්, (විනය පරික්ෂණ ඇත්නම් ඒ පිළිබඳ විස්තර සැපයිය යුතුය.) 2025 ඔක්තෝම්බර් 24 දිනට පූර්වාසන්න වසර හය (06) තුළ වැටුප් වර්ධක හය (6) උපයාගෙන ඇති/නැති බවත්, එම කාලය තුළ නිළධාරියාගේ /නිලධාරිනියගේ වැඩ ,හැසිරීම හා පැමිණීම සතුටුදායක /අසතුටුදායක බවත් සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා තිබෙන/නොතිබෙන බවත්, II පෙළ ජේලර් තනතුරට උසස් කිරීමට සෑම සුදුසුකමක්ම ඔහු / ඇය විසින් ලබා ගෙන ඇති /නැති බවත්, සහතික කර උසස් කිරීම නිර්දේශ කරමි/නොකරමි.

**(අනවශ්‍ය වචන කපා හැරීම අනිවාර්ය වේ)**

දිනය :- ..............................................  ............................................................

බන්ධනාගාර අධිකාරි
(නිල මුද්‍රාව තබන්න)

Scanned with CamScanner